## කුවේට් අරමුදල් වලින් පාලම් ප්‍රතිසංස්කරණය හා පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය - 2016

කුවේට් අරමුදල් වලින් පාලම් ප්‍රතිසංස්කරණය හා පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ අරාබි ආර්ථික සංවර්ධනය සඳහා කුවේට් අරමුදල අතර 1995 මාර්තු 27 දින හා 2001 සැප්තැම්බර් 03 දින එළඹි පිළිවෙලින් අංක 466 හා අංක 627 දරන ණය ගිවිසුම් සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

### 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම්වලට අනුව, එවකට මහා මාර්ග වරාය හා නාවික අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කෘෂිකාර්මික හා කාර්මික නිෂ්පාදනවල ප්‍රවාහන පිරිවැය අඩුකිරීම හා දිවයිනේ පළාත් හා අග නගරය අතර ගමන් කිරීමට ගතවන කාලය අඩුකිරීම මඟින් ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකයට සහායදීම ව්‍යාපෘතියේ අරමුණු වේ. මෙම ව්‍යාපෘතිය තුළින් තවදුරටත් මාර්ග ආරක්ෂාව දියුණු කරවීම සඳහා පටු හා දුර්වල පාලම් 32 ක් පුනරුත්ථාපනය, ප්‍රතිනිර්මාණය, ප්‍රතිස්ථාපනය සහ ගැටඹේ - ගන්නෝරුව මාර්ගය පුළුල් කිරීමද ඉලක්කගත කර ඇත. ණය ගිවිසුම ප්‍රකාරව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 3,432 කට සමාන කුවේට් ඩිනාර් මිලියන 10.12 ක් වන අතර ඉන් රු.මිලියන 1,728 කට සමාන කුවේට් ඩිනාර් මිලියන 5.10 ක් සැපයීම සඳහා අරාබි ආර්ථික සංවර්ධනය සඳහාවූ කුවේට් අරමුදල එකඟවී තිබුණි. 1995 මාර්තු 27 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කල අතර 1997 දෙසැම්බර් 31 වන විට මාස 33 ක් තුල නිමකිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘති කාලපරිච්ඡේදය 2016 මාර්තු 24 දින දක්වා තවත් වර්ෂ 19 කින් අවස්ථා 10 කදී දීර්ඝ කර තිබුණි. එනමුදු 2016 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.4 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල

කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම පිණිස මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

**(අ)** අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

**(ආ)** ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කල මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

**(ඇ)** ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගතවූ වත්කම් සහ වගකීම්, ණය වලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව,

**(ඈ)** ණය යටතේ ආපසු ගැනීම්, ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේ ද යන බව,

**(ඉ)** ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

**(ඊ)** ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේ ද යන බව,

**(උ)** ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේ ද යන බව,

**(ඌ)** මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

**(එ)** ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

---------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණය සඳහාවූ ඉල්ලුම්පත් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 3. මූල්‍ය සහ භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුල සහ 2016 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යයනය කිරීමට එකඟවූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුල | | 2016 දෙසැම්බර් 31 දිනට | |
| | කුවේට් ඩිනාර් මිලියන | රු. මිලියන | රු. මිලියන | කුවේට් ඩිනාර් මිලියන | රු. මිලියන | කුවේට් ඩිනාර් මිලියන | රු. මිලියන |
| අරාබි ආර්ථික සංවර්ධනය සඳහාවූ කුවේට් අරමුදල | 5.10 | 1,728 | 3.11 | 0.009 | 3.10 | 3.79 | 1,670 |
| ශ්‍රී ලංකා රජය | 5.02 | 1,704 | 2.25 | - | 2.25 | - | 1,688 |
| | 10.12 | 3,432 | 5.36 | 0.009 | 5.35 | 3.79 | 3,358 |

### 3.2 භෞතික ප්‍රගතිය

ලැබී ඇති තොරතුරු අනුව පටු හා දුර්වල පාලම් 32 ක් පුනරුත්ථාපනය, නැවත ඉදිකිරීම හා නැවත ස්ථාපිත කිරීම් හා ගැටඹේ - ගන්නෝරුව මාර්ගය පුළුල් කිරීම 2015 දෙසැම්බර් 31 දින වන විට නිමකර තිබුණි. කෙසේවුවද, ව්‍යාපෘතිය ආරම්භයේදී වැඩ කරගෙන යෑමෙන් ඉතිරිවූ රු.මිලියන 115.30 කට සමාන කුවේට් ඩිනාර් 256,224 ක මුදලක් උපයෝගී කරගෙන ගාල්ල - දෙණියාය - මාදම්පේ මාර්ගයේ පාලම් 03 ක් වර්ෂය තුළ නැවත ප්‍රතිසංවිධානය කර තිබුණි.

**3.3 ආර්ථික නොවූ ගනුදෙනු**

**-----------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතුවල වන්දි නිරවුල් කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් රු.මිලියන 69.23 ක පොළී මුදලක් 2016 දෙසැම්බර් 31 දින දක්වා ව්‍යාපෘතිය මඟින් වැය කර තිබුණු බව විගණනයට අනාවරණය විය.

(ආ) ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ඍජු සම්බන්ධයක් නොමැති විවෘත කිරීමේ උත්සව සඳහා රු. මිලියන 5.90 ක මුදලක් ව්‍යාපෘතියක් මඟින් ව්‍යාපෘති කාලය තුළ වැය කර තිබුණු බව නිරීක්ෂණය විය. තවද, ඉහත වියදම් සඳහා ආධාරක ලියවිලි විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

**3.4 ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීම**

**-------------------------------------**

2016 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් අවසන්වුවද, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිත ආයතනය හරහා ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය මඟින් වත්කම් හා වගකීම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙත පැවරීමටත්, ව්‍යාපෘතියේ කටයුතු නිමකිරීම සඳහාත් උපදෙස් ලබාදීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.